**Covid 19 සති පාසල**

**සබරගමු පළාත**

**සතිය - 2**

**පුරවැසි අධ්‍යාපනය** **9 ශ්‍රේණිය**

**ඒකකය -9.1 ජන සමාජයේ සුරක්ෂිත පැවැත්ම සඳහා ක්‍රියාකාරීව කටයුතු කිරීම**

**ක්‍රියාකාරකම - 9 – 11 සමාජ සුරක්ෂිතතාවය කෙරෙහි දායක වන ආයතන පිළිබඳ විමර්ශනය කරයි.**

**හැඳින්වීම -** සමාජ සුරක්ෂිතතාව පිළිබඳ හා සමාජ සුරක්ෂිතතාව කෙරෙහි බලපාන ආයතන පිළිබඳ ඔබට යම්කිසි අවබෝධයක් මේ වන විට ලැබී ඇතැයි සිතමි.ඒ අනුව රාජ්‍ය මගින් සමාජ සුරක්ෂිතතාව ඇති කිරීම සඳහා නීතිය යොදා ගන්නා ආකාරය පිළිබඳ මූලික අධ්‍යයනයක් මෙහිදී සිදු කරනු ලබයි. රාජ්‍ය මේ සඳහා අධිකරණය,පොලීසිය හා ආරක්ෂක හමුදා යොදා ගනී. මෙම අධිකාරී බලයට සියලු දෙනාම අනිවාර්යයෙන් යටත් විය යුතුය. දඬුවමට ඇති බිය නිසා සමාජයේ සියළු පුරවැසියන් රාජ්‍යය විසින් පනවන නීතියට යටත් වේ .

**ගුණාත්මක යෙදවුම් -** පෙළ පොත වැඩිහිටි සම්පත්දායක උපකාර

මාධ්‍යන් තුළින් ලබාගන්නා තොරතුරු

**ක්‍රියාකාරකම් සඳහා සිසුන් ට උපදෙස් -:**

**පියවර 01 -** පෙළ පොතේ පිටු අංක 10-19 දක්වා අවබෝධයෙන් කියවන්න

**පියවර02 -** අභ්‍යාස පොත භාවිතා කර ප්‍රශ්නය ලියා පිළිතුරු සපයන්න.

## ප්‍රශ්නාවලිය

1. නීතිය යනු කුමක්ද ?
2. නීතියේ ගුණාංග පහක් ලියන්න
3. නීති මූලාශ්‍ර මොනවාද ?
4. නීති වර්ග කරන ප්‍රධාන කොටස් දෙක නම් කර,දේශීය නීතිය කොටස් කර උදාහරණ දෙක බැගින් සපයන්න.
5. අන්තර් ජාතික නීතිය යනු කුමක්ද ?එයට අයත් නීති වර්ග තුනක් උදාහරණ ලෙස දෙන්න.
6. නීති බලාත්මක කිරීම සඳහා පවතින විවිධ ආයතන නම්කර ඒවා පිළිබඳ කෙටි හැඳින්වීම් කරන්න.

**<u>පසු වැඩ</u> ක්‍රියාකාරකම 1- 6 කරන්න.(මෙම ක්‍රියාකාරකම SBA ලකුණු දීම සඳහා ගුරුභවතාට භාවිතා කළ හැකිය.)**

**1 සතියේ ප්‍රශ්න අංක 06 ට පිළිතුරු සැපයීම අපහසු වී නම්,එය නැවත වැඩිදුරටත් මෙසේ පැහැදිලි කළ හැකිය.**

**6.සමාජ විරෝධී ක්‍රියා මැඩ පැවැත්වීම හා සමාජ සුරක්ෂිතතාව තහවුරු කිරීම සඳහා ක්‍රියාත්මක වන ආයතන මොනවාද ?**

**සැකසීම - M.A පත්මලතා මිය,ර/නිවි පලාවෙල රත්නාකර ම.වි.රත්නපුර**